**කල්පිටිය ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**-------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2017 මාර්තු 24 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශනය 2016 මාර්තු 24 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කල්පිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**-------------------------------------**

#### 1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

රු.13,435,961 ක් වූ වැටුප් ප්‍රතිපූර්ණ රු.13,196,538 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

#### 1.3.2 <u>නොසැසඳු පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 11 ක් සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ එකතුව රු.17,469,903 කට අදාල උපලේඛනවලට අනුව ශේෂ එකතුව රු.17,149,410 ක් වූයෙන් රු.828,429ක වෙනසක් අනාවරණය විය.

#### 1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) <u>ලැබිය යුතු ගිණුම්</u>

i. සමාලෝචිත වර්ෂය අවසානයට රු.76,900,778 ක් වූ ලැබිය යුතු මුදලින් වර්ෂයක් ඉක්මවා ලැබිය යුතු වටිනාකම රු49,866,109 ක් විය. 1989 සිට 2010 වර්ෂය දක්වා ලබාදී තිබෙන අත්තිකාරම් එකතුව රු.231,087 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

ii. 2015 ජනවාරි මාසයේ දී සේවයේ ස්ථිර කරන ලද කාර්ය මණ්ඩලයේ වැටුප්/දීමනාවලින් රු.18,718,312 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබීමට තිබුණි.

iii. 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.4,449,080 ක් වූ සේවක ණය අත්තිකාරම්වලින් විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය හා මියගිය සේවකයින් වශයෙන් 60 දෙනෙකුගෙන් වර්ෂ 3 ඉක්මවා අයවිය යුතු රු.487,546 ක් විය.

(ආ) <u>ගෙවිය යුතු ගිණුම්</u>

i. 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.34,172,803 ක් විය.

ii. පසුගිය වර්ෂවල සිට සභාව විසින් එකතු කර තිබූ මුද්දර බදු, වැට් බදු සහ භාණ්ඩ හා සේවා බදු පිළිවෙලින් රු.4,581,926 ක්, රු.1,874,996 ක් හා රු.289,388 ක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවා නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

ගිණුම් විෂයයන් 06 ක එකතුව රු.199,814,200 ක් වූ වත්කම් හා වගකීම් ශේෂ සනාථ කිරීම සඳහා වූ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකරන ලදි.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම**

පහත අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| | 129 (2) (ආ) සහ (ඊ) වගන්ති හා 150 (4) , 158 වගන්ති | (i) ප්‍රාදේශීය සභාව මගින් අයකර ගත යුතු වරිපනම්, අක්කර බදු, බදුකුලී, බලපත්‍ර ගාස්තු, උසාවි දඩ, මුද්දර ගාස්තු හා වැටුප් ප්‍රතිපූර්ණ නිසි පරිදි අයකර ගැනීමටද,<br>(ii) බලපත්‍ර ගාස්තු, වරිපනම් හා අක්කර බදු නොගෙවා පැහැර හරින්නන් හට නීතිමය පියවර ගැනීමට හා දේපල තහනම් කිරීමටද කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 371 (5) | 1989 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අවස්ථා 21 ක් යටතේ ලබාදී තිබූ එකතුව රු.251,087 ක්වූ අතුරු අග්‍රිම 2016 දෙසැම්බර් 31 වන විටද නිරවුල් කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | වසර 02 ක් ඉක්මවූ රු.520,366 ක් වටිනා තැන්පත් සභා ආදායමට ගැනීමට පියවර ගෙන නොතිබුණි. |

**02. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.23,079,818 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 23,005,549 ක් විය.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

-----------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ රු.74,269 ක වර්ධනය සඳහා සභාවේ උත්පාදිත නොවන වෙනත් ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

--------------------

**2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

------------------------------------

**පහත කරුණු නිරීක්ෂණය විය.**

(අ) සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 92 ක් වූ ඇස්තමේන්තුගත ආදායමෙන් රු.මිලියන 40 ක් පමණක් රැස්කර ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.35,023,043 ක් වූ හිඟ ආදායමෙන් රු.3,210,586 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ආදායම්වල සමස්ථ හිඟය රු.42,113,876 ක් විය.

**2.3.2 වරිපනම් බදු**

-------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.8,244,168 ක හිඟ මුදලක් වර්ෂය අවසාන වන විට අයකර ගැනීමට තිබුණු අතර, ඒ තුළ පසුගිය වර්ෂ ගණනාවකට අයත් හිඟ රු.6,885,171 ක් විය.

(ආ) වර්ෂ 05 කට වැඩි කාලයක සිට වරිපනම් බදු තක්සේරු සංශෝධනය කර නොතිබුණි.

**2.3.3 බදු කුලී**

-------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු බදුකුලී ආදායම් එකතුව රු.5,361,117 ක් වූ අතර, ඉන් සමාලෝචිත වර්ෂය තුළ රු.3,577,992 ක් පමණක් අයකර ගෙන තිබුණි.

(ආ) කල්පිටිය නව බස්නැවතුම්පල අංක 10 කඩ කාමරයෙන් රු.231,210 ක් සහ අංක 12 පැරණි කඩකාමරයෙන් රු.105,167 ක් වශයෙන් හිඟ කඩකුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කුරිඤ්ඤම්පිටිය උප කාර්යාල බලප්‍රදේශයෙන් අයවිය යුතු රු.1,444,267 ක් වූ හිඟ බදුකුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3.4 වෙනත් ආදායම්**

------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල රු.803,388 ක් වූ මුළු අක්කර බදුවලින් වර්ෂය තුළ රු.50,772 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ආ) අක්කර බදු අයවීමට තිබෙන ඉඩම් නිශ්චිතව හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

**2.3.5 මුද්දර ගාස්තු**

සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් ප්‍රධාන ලේකම්වරයාගෙන් මුද්දර ගාස්තු රු.10,432,532 ක් අයවිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

2016 වර්ෂය සඳහා වූ කාර්ය සාධන වාර්තාව පිළියෙල කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු ඉඩම් හා ගොඩනැඟිලි ඒකක 21 ක් තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙවන අර්ධ වර්ෂය සඳහා වූ මුද්දර ගාස්තු ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට රු.1,968,085 ක් වූ පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල් දායකය ගෙවීමට කටයුතු කර නොතිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අංක 0002890535 දරන ජංගම ගිණුමේ මාසික බැංකු සැසඳුම් තුලනය කර ගැනීම සඳහා අත ඉතිරි ශේෂයක් වශයෙන් රු.21,109 ක මුදලක් දක්වමින් සාවද්‍ය ලෙස මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර තිබුණි.

(ආ) රු.29,838 ක් සමඟ අක්‍රීය තත්ත්වයට පත්ව තිබූ අංක 2897245 දරන ජංගම ගිණුම සක්‍රීය කර ගැනීමට හෝ අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.4 හඳුනාගත් පාඩු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) "කැනපි හට්" 01 ක් හා පුස්තකාල පොත් 94 ක් අස්ථානගත වීම හේතුවෙන් පාඩු සිදුවී තිබුණි.

(ආ) කොඩි කණු 115 ක් දේශපාලන අධිකාරියේ 08 දෙනෙක් විසින් රැගෙන ගොස් තිබීම මත රු.147,344 ක අලාභයක් සිදුවී තිබුණි.

**3.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

වාහන 09 ක් සහ ඉලෙක්ට්‍රොනික් තරාදියක් වර්ෂ 01 ත්, 05 ත් අතර කාල පරාසයක් තුළ නිෂ්ක්‍රීයව තිබුණි.

## 3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

කල්පිටිය නගර සීමාවේ දෛනිකව එකතුවන  කසළ ටොන් 03 ක් පමණ ප්‍රතිචක්‍රීයකරණයට යොදා ගන්නා නමුත්, ප්‍රදේශයේ දෛනිකව එකතු වන තවත් කසළ ටොන් 07 පමණ විවෘතව ඉඩමකට බැහැර කිරීම හේතුවෙන් පරිසර ගැටළු ඇතිවීමට ඉඩකඩ පැවතුණි.

## 3.7 මානව සම්පත් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ ලේකම් තනතුර වසර ගණනාවක සිට පුරප්පාඩුව පැවතුණි.

(ආ) ද්වීතියික හා ප්‍රාථමික ශ්‍රේණිවල පිළිවෙලින් 06 ක සහ 03 ක පුරප්පාඩු සහ එම ශ්‍රේණිවල පිළිවෙලින් 05 ක හා 25 දෙනෙකුගේ අතිරික්තයක්ද පැවතුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

වයඹ ප්‍රධාන ලේකම්ගේ 2010 ඔක්තෝබර් 05 දිනැති අංක ව/ප්‍ර/ලේ/05/03 විගණන කමිටු දරන ලිපියට අනුව විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ දූර්වලතාවයන් වරින් වර මාගේ විගණන විමසුම් මඟින් ප්‍රාදේශීය සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධතිය | නිරීක්ෂණය |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබීම, ඉඩම් හා ගොඩනැඟිලි වාර්ෂිකව සමීක්ෂණය කර නොතිබීම. |
| (ආ) ආදායම් පාලනය | හිඟ ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබීම. |
| (ඇ) ගිණුම්කරණය | උපයෝගී ලේඛන යාවත්කාලීනව නඩත්තු නොකිරීම. බලප්‍රදේශයේ ජනනය වන සියළුම කසළ ප්‍රතිචක්‍රීයකරණය සඳහා යොමු නොකිරීම, කොම්පෝස්ට් පොහොර නිපදවීමේ කටයුතු සඳහා අවශ්‍ය ප්‍රමාණයටත් වඩා සේවකයන් සේවයේ යොදවා තිබීම. |
| (ඇ) කසළ කළමනාකරණය | (i) කුරිඤ්ඤම්පිටිය හා කඩයාමොට්ටේ උප කාර්යාලවලට කාර්යභාර නිලධාරීන් ලෙස පිළිවෙලින් ආදායම් පරීක්ෂක නිලධාරියෙකු හා රියදුරු මහතෙකු පත්කර තිබීම.<br>(ii) පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමට කටයුතු නොකිරීම |

| | | |
|---|---|---|
| (ඉ) | මානව සම්පත් කළමනාකරණය | සභාව සතු සියළුම වාහනවල දෛනික ධාවන සටහන් හා ඒවායේ සාරාංශ නිසි පරිදි විගණනය වෙත යොමු නොකිරීම. ක්‍රියාකාරී තත්ත්වයේ නොමැති හා ප්‍රයෝජනයට ගත නොහැකි සියළුම වාහන අපහරණය නොකිරීම. |
| (ඊ) | වාහන පාලනය | |
| (උ) | අත්තිකාරම් | අත්තිකාරම් නොපියවීම හා ප්‍රමාදයන් පැවතීම. |